**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තුමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව- VI වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2020/2021**

**LWU4323/LLU6715 - කම්කරු නීතිය**

**කාලය - පැය තුනයි (03)**

---

**දිනය- 2021 සැප්තැම්බර් 14** **වේලාව-පෙ.ව 9.30 සිට ප.ව 12.30 දක්වා**

---

**ප්‍රශ්න සංඛ්‍යාව - 05**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.**

1. ඊසි ටෙක් (Eazy Tech) පුද්ගලික සමාගම සුප්‍රසිද්ධ මෘදුකාංග සමාගමකි. මහීෂා 2021 ජනවාරි මාසයේදී මෘදුකාංග සැකසුම්වරියක ලෙස එම සමාගමට සම්බන්ධ විය. සමාගම සහ මහීෂා අතර වූ ගිවිසුමට අනුව සමාගම සේවාදායකයින්ගෙන් ඇනවුම් භාර ගෙන එම ඇනවුම් මහීෂා වෙත ලබා දෙයි. මාසයක් තුළ ඇය විසින් භාරගන්නා සහ සම්පූර්ණ කරන ඇනවුම් ප්‍රමාණය මත සමාගම විසින් සෑම මසකම ඇයට කොමිස් මුදලක් ගෙවනු ලබයි. තවදුරටත් , මහීෂා වෙනත් කිසිදු සමාගමක් සමග මෘදුකාංග සැකසීමේ ගිවිසුමකට ඇතුළත් වීම තහනම් කරන්නා වූ වගන්තියක්ද ගිවිසුමෙහි ඇතුළත් විය. මහීෂා සතියකට දින තුනක් සේවා ස්ථානයට වාර්තා කිරීම අවශ්‍ය වුවද ඇය පැමිණීමේ ලේඛණය අත්සන් කිරීම අවශ්‍ය නොවුණි. කෙසේ වෙතත් රට තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් සමාගම විසින් සියලුම සේවකයින්ට නිවසේ සිට සේවය කරන ලෙස ඉල්ලා සිටින ලදී. සේවකයින්ගේ පුද්ගලික අන්තර්ජාල දත්ත (data) භාවිතය වෙනුවෙන් සමාගම 'data allowance' නමින් විශේෂ දීමනාවක් ගෙවනු ලැබීය. නමුත් සමාගම මහීෂාට එම දීමනාව නොගෙවයි. පසුව, වැඩ මුර ක්‍රමය මත නිශ්චිත දිනයන්හිදී සේවකයින් සේවා ස්ථානය වෙත කැඳවීමට සමාගමේ කළමනාකාරීත්වය තීරණය කළේය. නමුත් කළමනාකාරීත්වය මහීෂාට දන්වා සිටියේ ඇයට තවදුරටත් නිවසේ සිට සේවය කළ හැකි බවයි.

තමාට අන්තර්ජාල දත්ත භාවිතය සඳහා වූ දීමනාව (data allowance) ලබා දෙන ලෙස මහීෂා සමාගමේ කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටියාය. නමුත් ඇය සමාගමේ සේවකයකු නොවන බව පවසමින් කළමනාකාරිත්වය විසින් එම දීමනාව ගෙවීම ප්‍රතික්ෂේප කරනු ලැබීය.

තමා සමාගමේ සේවකයෙකුද නැද්ද යන්න සම්බන්ධයෙන් මහීෂා ඔබේ උපදෙස් පතයි. අදාළ නෛතික අධිකාරීන් උපුටා දක්වමින් මහීෂාට උපදෙස් දෙන්න.

**(ලකුණු 25)**

2. "එක් එක් නඩුවේ සිද්ධිමය සාධක අනුව සාධාරණ සහ යුක්ති සහගත වන්නේ කුමක්ද යන්න තීරණය කිරීම සඳහා ව්‍යවස්ථාදායකය විසින් නැණවත් ලෙස විනිශ්චය සභාව වෙත නොබිඳූ අභිමතයක් ලබා දී ඇත. සැබවින්ම මෙම අභිමතය ක්‍රියාත්මක කළ යුත්තේ විනිශ්චයක ආකාරයෙනි. නමුත් විශේෂයෙන්ම  ව්‍යවස්ථාදායකය විසින් පවා එහි ක්‍රියාකාරී වපසරිය සීමා කිරීමට හෝ නිශ්චය කිරීමට තෝරා නොගෙන ඇති අවස්ථාවක, එම අභිමතය ක්‍රියාත්මක කිරීමට බාධා වන ආකාරයේ දැඩි රීතීන් නියම කිරීමට මෙම අධිකරණයට සිදු වන්නේ නම් එය, එම අභිමතය මනා ලෙස ක්‍රියාත්මක කිරීමට හිතකර නොවනු ඇත".

   - Sharvananda J, in ***Caledonian (Ceylon) Tea and Rubber Estate Ltd Vs. Hillman*** (79 1 NLR 142)

කම්කරු විනිශ්චය සභාවක බලතල සහ කාර්යයන්ට අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීරණ ඇසුරින් ඉහත ප්‍රකාශය අගයන්න.

**(ලකුණු 25)**

3. (අ) ASI පාවහන් පුද්ගලික සමාගම 2018 වර්ෂයේදී සිය ව්‍යාපාරික කටයුතු ආරම්භ කළ අතර ආරම්භයේ සිට සේවකයින් හැටක් සේවයේ යොදවා ඇත. සමාගමේ ඇතිවූ මූල්‍ය අර්බුදයක් හේතුවෙන් එහි මීගමුවේ පිහිටි ප්‍රාදේශීය ශාඛාව වසා දැමීමට සමාගමේ කළමනාකාරිත්වය විසින් තීරණය කරන ලදී. ශාඛාව වසා දැමීම හේතුවෙන් 01.11.2021 දින සිට සුරංග, රන්ජන්, නුවන් සහ රුවිනිගේ සේවය අවසන් කරනු ලබන බවට සමාගම විසින් දැනුම් දෙන ලදී.

සුරංග මීගමුව ශාඛාවේ කළමනාකාරවරයා වේ. 2019 ජනවාරි මාසයේදී එම තනතුරට පත් කරනු ලැබූ සුරංග සමාගමේ ස්ථිර සේවකයෙකි. රන්ජන් සහ නුවන් මීගමුව ශාඛාවේ විකිණුම් සහායකයින් වන අතර ඔවුන් වසරක කොන්ත්‍රාත්තුවක් මත 2020.05.01 දින සේවයට බඳවා ගෙන ඇත. 2021.05.01 දින සිට බලාත්මක වන පරිදි සමාගම ඔවුන්ගේ කොන්ත්‍රාත්තුව තවත් මාස හයකට දීර්ඝ කරනු ලැබිණි. රුවිනි පිරිසිදු කරන්නියක ලෙස 2019 වර්ෂයේ සිට මෙම ශාඛාවේ සේවය කරන අතර ඇය අක්‍රමවත් ලෙස සේවයට වාර්තා කරයි. ශාඛාව තුළ සේවයක් අවශ්‍ය වූ විට පමණක් රුවිනිව සේවයට කැඳවනු ලබයි. ඇයට දෛනික පදනම මත ගෙවීම් සිදු කරනු ලැබේ.

සුරංග, රන්ජන්, නුවන් සහ රුවිනි ඔවුන්ගේ සේවය අවසන් කිරීමට එරෙහිව සහනයක් ලබා ගැනීම සඳහා ඔබගේ උපදෙස් පතයි. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් ඔවුන්ට උපදෙස් දෙන්න.

**(ලකුණු 15)**

(ආ) කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පැන නැගෙමින් පවතින කම්කරු ගැටලු කෙරෙහි අවධානය යොමු කරමින් සේවකයින්ගේ සේවය අවසන් කිරීම පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත සේවා යෝජකයින්ගේ සහ සේවකයින්ගේ අයිතීන් තුළනය කරයිද යන්න අගයන්න.

**(ලකුණු 10)**

4. (අ) අන්තර්ජාතික කම්කරු ප්‍රමිතීන් ඇසුරින් ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් අදාළ වන නෛතික රාමුව අගයන්න.

**(ලකුණු 13)**

(ආ) ළමුන් සේවයේ යෙදවීම සම්බන්ධ ශ්‍රී ලංකාවේ කම්කරු නීති තත්වය අන්තර්ජාතික කම්කරු ප්‍රමිතීන් හා අනුකූල වේද යන්න අගයන්න

**(ලකුණු 12)**

5. නිව් ලංකා ඇඟලුම් පුද්ගලික සමාගම රටවල් ගණනාවකට ඇඟලුම් අපනයනය කරයි. නිව් ලංකා සමාගමේ 75% ක් පමණ සේවකයෝ 'සමගි කම්කරු සමිතිය' නම් වෘත්තීය සමිතියේ සාමාජිකයෝ වෙති. සෝමරත්න, වෘත්තීය සමිතියේ සාමාජිකයෙකු වන අතර ඔහු පළාත් පාලන ඡන්දයට තරග කිරීමට අපේක්ෂා කරයි. මෑතකදී සමගි කම්කරු සමිතියේ සාමාජිකයින් විසින් සෝමරත්නගේ ඡන්ද ව්‍යාපාරයට මූල්‍ය ආධාර සැපයීම සඳහා වූ යෝජනාවක් සම්මත කර ගන්නා ලදී.

මේ අතරතුර නිව් ලංකා සමාගම නව සේවකයින් 25 දෙනෙකු බඳවා ගත් අතර 'සමගි කම්කරු සමිතිය' විසින් සංවිධානය කරන කිසිදු වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් සඳහා සම්බන්ධ නොවන ලෙස ඔවුන්ට උපදෙස් ලබා දුනි. සෝමරත්නගේ ඡන්ද ව්‍යාපාරය සඳහා මුදල් සැපයීමෙන් සහ ආධාර කිරීමෙන් වලකින ලෙසට සමාගම් කළමනාකාරීත්වය විසින් 'සමගි කම්කරු සමිතියේ සභාපති වෙත ලිපියක් නිකුත් කරන ලදී. එසේම කළමනාකාරීත්වය තීරණය කරනු ලැබුවේ වෘත්තීය සමිතිය විසින් සෝමරත්නගේ ඡන්ද ව්‍යාපාරය සඳහා සහය දැක්වීමේ තීරණය ඉවත් කර ගන්නා තුරු වෘත්තීය සමිතිය සමඟ කිසිදු සාකච්ඡාවක් නොපැවැත්වීමටයි. කෙසේවෙතත්, 'සමගි කම්කරු සමිතිය විසින් ඡන්දයේදී සෝමරත්නට සහය දැක්වීම සඳහා වූ තීරණය මත දිගටම කටයුතු කිරීමට තීරණය කරන ලදී. වෘත්තීය සමිති කටයුතු සඳහා කළමනාකාරීත්වය මැදිහත් වීම කෙරෙහි අප්‍රසාදය පළ කිරීම සඳහා සංකේත වැඩ වර්ජනයක් පැවැත්වීමට වෘත්තීය සමිති සාමාජිකයෝ තීරණය කළහ.

වැඩ වර්ජනය අතරතුර 'සමගි කම්කරු සමිතිය විසින් සමාගම් පරිශ්‍රයේ උද්ඝෝෂණයක් පවත්වන ලදී. උද්ඝෝෂකයන් සමාගමේ දොරවල් සහ ගේට්ටු අවහිර කළ අතර සමාගමේ අපනයන ඇනවුම් සඳහා භාණ්ඩ ප්‍රවාහනය කිරීම වලකා දැමීය. ඇතැම් වෘත්තීය සමිති සාමාජිකයෝ උද්ඝෝෂණය අතරතුරදී ප්‍රධාන ගේට්ටුවේ CCTV කැමරා පද්ධතියට හානි සිදු කළහ. ඇතැම් උද්ඝෝෂකයෝ මුහුණු ආවරණ පැළඳීමෙන් තොරව උද්ඝෝෂනයට සහභාගි වූහ.

ඉහත සිද්ධිය හා සම්බන්ධ නෛතික ගැටලු හඳුනාගෙන අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් එම ගැටලුවලට අදාළ නෛතික තත්වය සාකච්ඡා කරන්න.

**(ලකුණු 25)**

****හිමිකම් ඇවිරිණි****